00023

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව

උපාධි වැඩසටහන 3වන මට්ටම - 2020/2021

අවසාන පරීක්ෂණය

**EPU3338 - මුල් ළමාවිය ආයතන හා ප්‍රාථමික පාසල් නිර්මාණය කිරීම හා සැලසුම් කිරීම**

කාලය - පැය දෙකයි. **(02)**

---

දිනය - **2023.01.29** වේලාව - පෙ.ව.**09.30** - පෙ.ව.**11.30** දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

**I වන කොටස**

01. ආයතනයක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.

02. පෙරපාසලේ ප්‍රධානාචාර්යවරියක සතුවිය යුතු නායකත්ව නිපුණතා පහක් **(05)** ලියන්න.

03. සංවිධානයක නායකයකු බලය රැස්කර ගන්නා ප්‍රභවයන් පහක් **(05)** ලියන්න.

04. ගුරුවරයකුගේ සමාජ වගකීම කුමක් ද? උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

05. එළිමහන් ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී ප්‍රාථමික පාසල් ගුරුවරයකු ලෙස ඔබ සලකා බලනු ලබන සාධක පහක් **(05)** ලියන්න.

06. පෙරපාසලක හෝ විධිමත් පාසලක පවතින දීර්ඝකාලීන සැලසුම් දෙකක් **(02)** නම් කරන්න.

07. විධිමත් ඇගයීම සඳහා උදාහරණ තුනක් **(03)** ද, අවිධිමත් ඇගයීම සඳහා උදාහරණ තුනක් **(03)** ද ඉදිරිපත් කරන්න.

08. පෙරපාසල් අධ්‍යාපනය සඳහා ව්‍යවස්ථාපිත මණ්ඩල වශයෙන් හඳුනාගෙන ඇති ආයතන පහක් **(05)** ලියන්න.

(ලකුණු 05 x 08 = 40)

<u>දෙවන කොටස</u>

09. i. "කිසියම් සංවිධානයක අවසාන අරමුණ විය යුත්තේ එම සංවිධානය මගින් මෙහෙවරක් ලබා දෙන ජනතාවගේ අවශ්‍යතාවන් මැනවින් සපුරාලීම ය." මෙහි දී සංවිධානය ලෙස පෙරපාසල ගෙන ඉහත අදහස උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. "Robbins (1992) ට අනුව සංවිධාන ව්‍යුහයක් සකස් කිරීමට පෙර කළමනාකරුවකු විසින් හඳුනාගෙන සලකා බැලිය යුතු ප්‍රධාන අංග හයක් (06) ඇත." එම අංග හතරක් **(04)** පිළිබඳ ව ඔබේ අදහස් කෙටියෙන් ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

10. i. "බෙනින් (1995) නායකයකු හා කළමනාකරුවකු අතර වෙනස්කම් ඉදිරිපත් කර ඇත." ඒ අනුව ඔබ නායකයා හඳුනාගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. නායකයකු ලෙස පෙරපාසල් ප්‍රධානාචාර්යවරියක මුහුණ දෙනු ලබන අභියෝග පහක් **(05)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. i. **"කළමනාකරණය යනු විධිමත් ලෙස සංවිධානය වූ කණ්ඩායමක සාමාජිකයින්ගෙන් වැඩ ගැනීමේ කලාවයි."** මෙම අදහස කරුණු ඉදිරිපත් කරමින් තහවුරු කරන්න. (ලකුණු 10)

ii. **"සැලසුම් කිරීම"** යන යෙදුම නිර්වචනය කරන්න. ඕනෑම කාර්යයක් **සැලසුම් කිරීමේ** වැදගත්කම උදාහරණ සමගින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. i. **දීර්ඝකාලීන, කෙටිකාලීන, දෛනික** යන සැලසුම් වෙන වෙන ම පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. පෙර පාසලක් උදෙසා එක් දිනක සැලැස්මක් පිළියෙල කරන්න. (ලකුණු 10)

13. i. ගුරුවරයකු වශයෙන් ඔබට පාසලක හැසිරවීමට සිදුවන **සම්පත් වර්ග කෙටියෙන්** පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. **"සෑම ගුරුවරයකු ම කාල කළමනාකරණයෙහි ප්‍රවීණයකු විය යුතු ම ය."** කාල කළමනාකරණයෙහි ප්‍රවීණයකු වීමේ අවශ්‍යතාව උදාහරණ සහිත ව තහවුරු කරන්න.

(ලකුණු 10)

\- හිමිකම් ඇවිරිණි. -